**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය පළමුවන සංශෝධනය.</u>**

**<u>සංශෝධන ලැයිස්තුව</u>**

| අනු අංකය | විෂය | රා.සේ.කො.ස. අනුමත කරන ලද සංශෝධන |
|---|---|---|
| 1. | 1.6 | යොමු අංකය : PSC/EST/02-01-18/01/2014 දිනය : 2014.11.28<br>පළමුවන සංශෝධිත දිනය : 2024.06.07 . |
| 2. | 05 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සංශෝධනය විය යුතුය. |
| 3. | 9.1 | වගුවේ අනෙක් රාජ්‍ය භාෂාව යටතේ ඇති කරුණ පහත පරිදි සංශෝධනය කරන්න.<br><br>**භාෂාව** — **ලබා ගත යුතු ප්‍රවීණතාව**<br>2. අනෙක් රාජ්‍ය භාෂාව — රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවලට අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 4. | 10.1.1.1. හි (IV),<br>10.2.1.1. හි (II),<br>10.3.1.1 හි (IV) | පහත පරිදි සංශෝධනය විය යුතුය.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම. |
| 5. | 13. | සක්‍රිය සේවා කාලය යනු ...... කොටස ඉවත් කර ,අදාළ නොවේ" ලෙස සටහන් කරන්න. |
| 6. | 14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය | මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති PL-03-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.<br><br>**(i) PL-03-III ශ්‍රේණිය**<br><br>(අ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවරක් හිමිව ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්<br><br>(ආ) III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය(10)ක් හෝ ඊට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද, නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව II හෝ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අදාළ සෙසු සුදුසුකම් සම්පූර්ණ නොකළ නිලධරයන්<br><br>PL-03- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. |

**(ii) PL-03 - II ශ්‍රේණිය**

(අ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවරක් හිමිව ඇති අවුරුදු දහය (10)කට වඩා වැඩි එහෙත් අවුරුදු දහනවය (19) කට නොවැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහය(10)ක් හෝ ඊට වැඩියෙන් උපයාගෙන ඇති සහ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව II ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්.

(ආ) PL-03-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු නවය (09)ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) ක් සම්පූර්ණ වූවද, නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සම්පූර්ණ නොකළ නිලධාරීන්

PL-03- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**(iii) PL-03 - I ශ්‍රේණිය**

(අ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවරක් හිමිව ඇති අවුරුදු දහනවය (19)ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විසි අටකට (28) කට නොවැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහනවයක් (19) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමෙ පටිපාටිය අනුව I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්.

(ආ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප හිමි එම ශ්‍රේණියේ අවුරුදු 09ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු දහඅටක් (18) කට නොවැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක දහඅටක් (18) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමෙ පටිපාටිය අනුව I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්.

(ඇ) PL-03-2006-A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09)ක් සම්පූර්ණ වූවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ඉහත සඳහන් සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්.

PL-03- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**(iv) PL-03 - විශේෂ ශ්‍රේණිය**

(අ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවරක් හිමිව ඇති අවුරුදු විසිඅට(28) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක විසිඅට (28) ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමෙ පරිපාටිය අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් .

(ආ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි II ශ්‍රේණියේ වැටුප හිමි එම ශ්‍රේණියේ වසර දහඅට(18) ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක දහඅට (18) ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමෙ පරිපාටිය අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් .

| | | |
|---|---|---|
| | | (ඇ) දැනටමත් PL-03-2016 වැටුප් ක්‍රමයෙහි I ශ්‍රේණියේ වැටුප හිමි එම ශ්‍රේණියේ අවුරුදු නවය(09)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ එම කාලයට අදාළ වැටුප් වර්ධක නවය(09)ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් .<br><br>(ඈ) PL-03-2006-A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබාදීඇති තනතුරක හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන සේවකයින්.<br><br>PL-03- විශේෂශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. |
| 7. | 15 | සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. |